**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - 2017**

**-------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (" අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 අනෙකුත් නීති හා රෙගුලාසි අවශ්‍යතාවයන්ගේ වාර්තාව

මෙම මූල්‍ය ප්‍රකාශන 1988 අංක 30 දරන බැංකු පනතින් සහ ඊට අදාළ සංශෝධන වලින් අවශ්‍ය කෙරෙන තොරතුරු අනුව ඉදිරිපත් කර තිබුණි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - LKAS/SLFRS

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) LKAS 37 – ප්‍රකාරව ප්‍රතිපාදන, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම් වනාහි කාලය හා ගෙවීම් ප්‍රමාණය පිළිබඳ වර්තමාන වගකීම වේ. කෙසේ වුවද, ප්‍රමිතියේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂා කළ නමුත් ක්‍රියාත්මක නොකළ වැඩසටහන් සඳහා අවස්ථා 02 කදී ගෙවිය යුතු වෙනත් පොදුකාර්ය වියදම් වශයෙන් රු.15,330,707 ක බැරකම් බැංකුව විසින් හඳුනාගෙන තිබුණි.

(ආ) සම්බන්ධිත පාර්ශව ගනුදෙනු වන එකතුව රු.2,966,135 ක් වූ තැන්පතු සහ එකතුව රු.4,496,180 ක් වූ ණය LKAS 24 - සම්බන්ධිත පාර්ශවයන්ගේ හෙළිදරව් කිරීම් විධිවිධාන ප්‍රකාරව හඳුනාගෙන හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 29 දින ගනුදෙනුකරුවෙකු විසින් තැන්පත් කළ රු.9,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු චෙක්පතක් 2018 ජනවාරි 03 දින නිෂ්කාෂණය වූ අතර එය සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන තිබුණි. ඒ අනුව, ස්ථාවර තැන්පතු එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබූ අතර, එයට අදාළ රු.13,870 ක් වූ පොලියද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වැඩියෙන් උපචිත කර දක්වා තිබුණි.

(ආ) සබරගමුව පළාතට අදාළ 2017 දෙසැම්බර් මාසය සඳහා වන උපයන විට ගෙවීමේ බදු (PAYE) වියදම වූ රු.11,162,064 ගිණුම්ගත කර නොතිබුණි. මේ හේතුවෙන් උපයන විට ගෙවීමේ බදු වියදම (PAYE) සහ අදාල වගකීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගනුදෙනුකරුවන්ගේ පොලී ආදායම් මත රඳවා ගැනීමේ බදු වැරදියට ගණනය කිරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට පොලී මත ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු රු.6,616,670 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු (VAT) වැරදි ලෙස ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ VAT වියදම සහ 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු VAT ශේෂය රු.3,820,897 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 ගෙවිය යුතු ගිණුම්

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ සිට පැවැත එන රු.7,295,193 ක ගෙවිය යුතු VAT ශේෂයක් ප්‍රේෂණය කිරීමකින් තොරව පැවැති බව නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.167,509,776 ක මුළු ණය හිමි ශේෂයෙන් සියයට 57 ක් හෙවත් රු.95,188,392ක් වයඹ සහ ඌව යන පළාත් 02 හි පිහිටි ශාඛා දෙකෙහි සහ ප්‍රධාන කාර්යාලයේ පැවැති ණය ශේෂයේ එකතුව නියෝජනය කර තිබුණි. ඉහත ශේෂයෙන් සියයට 79 ක් වර්ෂයකට අධික කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව ගිණුම්වල පැවැති බව නිරීක්ෂණය විය.

(ඇ) මහවැලි අධිකාරියෙන් 2002 අප්‍රේල් 01 දින ලබාගෙන තිබූ ණය 02 ක පොලී අඛණ්ඩව උපචිතව පැවැති අතර, 2017 දෙසැම්බර් 31 දින වන විටත් කිසිඳු පොලියක් ගෙවීම සඳහා බැංකුව විසින් පියවර ගෙන නොතිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට මුළු උපචිත පොලිය රු.36,764,636 ක් වූ අතර, ඉන් 2016 දෙසැම්බර් 31 දිනට පැවැති උපචිත පොලී වටිනාකම රු.33,468,491 ක් වී තිබුණි.

(ඈ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nations Development Programme – UNDP) සහ එවකට රුහුණු සංවර්ධන බැංකුව අතර ඇති වූ ගිවිසුම ප්‍රකාරව, බැංකුව විසින් නිකුත් කරන ලද ණය සඳහා ඇපකර අරමුදලක් ලෙස UNDP විසින් ණය මුදලක් ලබා දී තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ දුර්වලතාවයන් හඳුනාගැනීම හේතුවෙන් UNDP විසින් ව්‍යාපෘතිය නවතා දැමූ අතර ඒ බව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට 2012 වර්ෂයේදී දැනුම් දී තිබුණි. 2013 අප්‍රේල් 30 දින පැවති රැස්වීමේදී පියවර 03 ක ප්‍රවේශයකින් අරමුදල් හා පොලී ආපසු ලබාදීමට දෙපාර්ශවයම එකඟ වී තිබුණි. කෙසේ වුවද, එකඟ වූ පරිදි අරමුදල් සහ පොලී නිරවුල් කිරීමට බැංකුව විසින් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ඇපකර අරමුදලේ ශේෂය සහ ගෙවිය යුතු පොලිය පිළිවෙලින් රු.11,003,743 ක් සහ රු.20,719,172 ක් වී තිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ පහත අවස්ථාවන් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2016 අංක 01 දරන බැංකු පනතේ නියෝග | බැංකුව විසින් 2017 දෙවන කාර්තුව සඳහා අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (Capital Adequacy Ratio) වන සියයට 10 පවත්වා ගැනීමට අපොහොසත් වී තිබුණු අතර එය 2017 ජුනි 30 දිනට සියයට 9.26 ක්ව පැවතුණි. එම අනුපාතය 2017 තුන්වන කාර්තුවේදී සියයට 8.67 ක්ව පැවති අතර පවත්වා ගත යුතු අවමය සියයට 11.25 ක්ව තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 පරිච්ඡේදය<br>2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 ඡේදය | බැංකුව විසින් පනතේ සහ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව සේවක පාරිශ්‍රමිකයෙන් උපයන විට ගෙවීමේ බදු (PAYE) අඩු නොකර බැංකුව සිය තැන්පතුවලින් එකතුව රු.118,496,598 ක් උපයන විට බදු ලෙස සමාලෝචිත වර්ෂය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයට පටහැනිව ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා සඳහා පිරිවැය රු.98,900 ක් වූ ජංගම දුරකථනයක් බැංකුවේ අරමුදල් භාවිතා කරමින් මිලදී ගෙන තිබුණි. |
| (ඈ) | බැංකු චක්‍රලේඛ | |
| | (i) 2016 දෙසැම්බර් 09 දිනැති අංක 2016/32 දරන මුදල් චක්‍රලේඛය | ගෙවීම් සිදුකිරීමට පෙර, ගෙවීම් වවුචර් මාණ්ඩලික ශ්‍රේණියේ 3 III සිට 3 I සහ මාණ්ඩලික ශ්‍රේණියේ II හෝ ඉහළ නිලධාරීන් දෙදෙනෙකු විසින් සහතික කළ යුතුය. කෙසේ වෙතත්, නියැදි විගණන පරීක්ෂාවේදී එකතුව රු.15,436,719 ක් වූ ගෙවීම් වවුචර් 10 ක් මාණ්ඩලික ශ්‍රේණියේ II හෝ ඉහළ නිලධාරියෙකු විසින් සහතික කර නොතිබූ බව නිරීක්ෂණය විය. |
| | (ii) 2010 දෙසැම්බර් 28 දිනැති අංක 2010/22 දරන පරිපාලන චක්‍රලේඛය | සේවක ණය ලබාදීමේදී, ණය මුදලින් සියයට 01 ක් අඩු කොට එය ප්‍රධාන කාර්යාලයේ සේවක ණය ආරක්ෂණ අරමුදලට (Staff loan Assurance Fund) බැර කිරීම සඳහා ප්‍රේෂණය කළ යුතුය. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට පැවැති රු.1,713,496 ක් එලෙස ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය නොකර ශාඛා ගිණුම්වල පැවතුණි. |
| (ඉ) | බැංකු ප්‍රසම්පාදන අත්පොත | |
| | (i) 5.4.6 ඡේදය | කොන්ත්‍රාත් කාර්යයන් 03 ක් සඳහා කොන්ත්‍රාත් වටිනාකමෙන් අවම වශයෙන් සියයට 5 ක කාර්යසාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණි. |
| | (ii) 8.9 ඡේදය | වටිනාකම රු.250,000 ඉක්ම වූ කොන්ත්‍රාත් අවස්ථා 05 ක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම්වලින් රු.1,283,929,506 ක බදු පසු ශුද්ධ ලාභයක් වාර්තා කර තිබූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු.641,288,212 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු.642,641,294 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ ණය සහ අත්තිකාරම් රු.මිලියන 22,222 කින් වැඩිවීම හා ඊට අනුකූලව ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී රු.මිලියන 4,573 කින් වැඩිවීමත්, ස්ථාවර තැන්පතු රු.මිලියන 7,844 කින් වැඩිවීම මඟින් ඊට අනුකූලව ස්ථාවර තැන්පතු පොලී රු.මිලියන 2,179 කින් පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවීම මෙම වර්ධනය කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී රු.191,704,369 ක්ව පැවති 2013 වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.1,283,929,506 ක් ව පැවතුණි. පුද්ගල පඩිනඩි, ක්ෂය සහ බදු ගැලපීමෙන් පසු බැංකුවේ එකතු කළ අගය, රු.මිලියන 8,579 ක් වී තිබුණි. පසුගිය වර්ෂයේ බැංකුවේ එකතු කළ අගය රු.මිලියන 7,015 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 ගිණුම්කරණ අනුපාත

ආංශික අනුපාතවලට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සියයට 3.2ක් වන බලපත්‍රලාභී විශේෂිත බැංකු අනුපාතයට සාපේක්ෂව 2017 වර්ෂය සඳහා සියයට 6.45ක ඉහළ පොලී ආන්තිකයක් නිරීක්ෂණය විය.

(ආ) සියයට 54.4ක් වන ක්ෂේත්‍ර අනුපාතයට සාපේක්ෂව 2017 වර්ෂය සඳහා මෙහෙයුම් වියදම්වලට සේවක පිරිවැය සියයට 72.70ක් වී තිබුණි.

### 3.2.2 බැංකුවේ ද්‍රවශීලතා පරතරය

2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් පිළිබඳව විශ්ලේෂණය කිරීමේදී මාස 3 දක්වා, මාස 3-12 දක්වා සහ වර්ෂ 5 ට වැඩි මුළු වගකීම්, මුළු වත්කම්වලට වඩා විශාල අතිරික්තයක් වූ අතර 2016 වර්ෂය අවසානයට මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් මත ද්‍රවශීලතා පරතරය පිළිවෙලින් රු. 5,042,356,201ක්, රු.11,007,939,222 ක් සහ රු.18,145,882,193 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 මෙහෙයුම් හා සමාලෝචනය

(අ) 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත අනුව කෘෂිකර්මය, කර්මාන්ත, වෙළදාම, වාණිජ, පශු සම්පත්, ධීවර කටයුතු හා කාන්තා සවිබල ගැන්වීම් ප්‍රවර්ධනය මඟින් ශ්‍රී ලංකාවේ සමස්ත ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය පහසු කරලීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා කුඩා හා මධ්‍ය ව්‍යාවසායයන් සඳහා මූල්‍ය සහාය ලබාදීම බැංකුවේ අරමුණු වේ.

2017 වර්ෂය තුළ ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමේ දී බැංකුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු. මිලියන 125,552ක ඉලක්කගත මුළු ණය මුදලින් සියයට 50ක් පමණක් ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතින් සඳහන් කර ඇති කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳාම හා වානිජ සහ ප්‍රවාහනය වැනි විශේෂයෙන් නිර්දේශිත ක්ෂේත්‍ර සඳහා අවධානය යොමු කර තිබූ අතර එම ක්ෂේත්‍රවලට සත්‍ය ණයවලින් ලබාදී තිබූ ප්‍රතිශතයද එම ප්‍රමාණයම වි තිබුණි.

(ii) නිවාස ක්ෂේත්‍රය පිළිබඳව පනත මඟින් විශේෂයෙන් නිර්දේශ කර නොමැති වුවද, බැංකුව විසින් සියයට 27 ක් ඉලක්ක කරමින් සියයට 25 ක ණය ලබා දී තිබුණි.

(ආ) බැංකුවේ සංයුක්ත සැලැස්ම (Corporate Plan) සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායමට පිරිවැය හා ස්කන්ධය මත ප්‍රතිලාභය පිළිවෙලින් සියයට 8.6 සහ සියයට 22 ක් වශයෙන් ඉතාමත් අහිතකර ආකාරයෙන් විචලනය වී තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට මුළු ණය සහ අත්තිකාරම් වටිනාකම රු.මිලියන 130,325 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ණය සහ අත්තිකාරම්වලින් අක්‍රීය ණය වර්ගීකරණයේ එකතුව රු.මිලියන 4,191 ක් හෙවත් සියයට 3.22 ක් විය. තවද, එම අක්රීය ණය ශේෂයෙන් එකතුව රු.මිලියන 377 ක් 2018 පෙබරවාරි 28 දින වන විටත් තවදුරටත් අක්‍රීය වී පැවතුණි. ඉහත සඳහන් අක්‍රීය ණය සහ අත්තිකාරම් වර්ගීකරණය පහත පරිදි වේ.

| හිඟ හිටි කාල පරිච්ඡේදය | වර්ගය | **2017.12.31 දිනට අක්‍රීය ශේෂය** | වටිනාකම මුළු අක්‍රීය ණය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස | **2018.02.28 දිනට අක්‍රීය ණය ශේෂය** | වටිනාකම මුළු අක්‍රීය ණය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | (රු.මිලියන) | % | (රු.මිලියන) | % |
| මාස 3-6 | විශේෂිත සඳහන් කිරීම් ණය | 986 | 23 | 240 | 64 |
| මාස 6-12 | අපේක්ෂිත මට්ටමට අඩු ණය | 885 | 21 | 23 | 6 |
| මාස 12-18 | සැක සහිත ණය | 533 | 13 | 22 | 6 |
| මාස 18ට වැඩි | අලාභ ණය | 1,787 | 43 | 92 | 24 |
| එකතුව | | **4,191** | **100** | **377** | **100** |

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත් ට්‍රැක්ටරයක් මිලදී ගැනීම සඳහා ලබාදුන් රු.177,000 ක ණය මුදලක් ගෙවීම පැහැර හැර ඇති ගනුදෙනුකරුවකුට එරෙහිව බැංකුව විසින් 2003 වර්ෂයේදී නඩුවක් ගොනු කර තිබූ අතර 2017 දෙසැම්බර් 31 දක්වා නීතිඥ ගාස්තු ලෙස බැංකුව විසින් රු.637,310 ක් වැයකර තිබුණි.

(ආ) ආයතනික සමාජ වගකීම් වැඩසටහන යටතේ බෞද්ධ පන්සල් දෙකක් අලුත්වැඩියා කිරීම සඳහා වගකිව යුතු නිලධාරියෙකු විසින් පිළිගත හැකි ආකාරයෙන් පිළියෙල කරන ලද ප්‍රමාණ පත්‍ර (Bills of Quantity) නොමැතිව 2017 මැයි මාසයේදී කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.1,500,000 ක් බැංකුව විසින් ගෙවා තිබුණි. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාළ නිශ්චිත කාරණය වෙනුවෙන් මෙම අරමුදල් උපයෝජනය කර නොතිබූ බව අනාවරණය වූ අතර, බැංකුවේ අරමුදල උපයෝජනය කළ ආකාරය පිළිබඳ පසු විපරම් කටයුතු ද බැංකුව විසින් සිදුකර නොතිබුණි.

(ඇ) බැංකුව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගීතාවයෙන් සනීපාරක්ෂක පහසුකම් නංවාලීමේ වැඩසටහන යටතේ මධ්‍යම, ඌව, දකුණ සහ වයඹ පලාත් පාසැල් 09 ක සිදු කරන ලද ඉදිකිරීම්වල ප්‍රගතිය සියයට 25 ක් බව 2017 දෙසැම්බර් 19 දිනැති ප්‍රගති වාර්තාවේ සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, 2018 ජනවාරි 24 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් දුර්වලතා

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් එක් කාර්තුව අවසානයේ දින 10 ක් ඇතුළත අදාළ තොරතුරු මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා වන පොලී සහනාධාර ප්‍රතිපූර්ණය කරනු ලැබේ. කෙසේ වෙතත්, ඉල්ලීම් කිරීමේදී දින දෙකේ සිට දින 26 ක් දක්වා වන පරාසයක ප්‍රමාදයන් පැවති බව නිරීක්ෂණය විය. තෙවන කාර්තුව අවසානය දක්වා ලැබිය යුතු රු.මිලියන 329 ක පොලී සහනාධාර මුදල් 2018 පෙබරවාරි 29 දින වන විටත් මහා භාණ්ඩාගාරයෙන් ලැබී නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩලය පත් කරගන්නා අවස්ථාවේදී සේවකයින්ගෙන් එකතු කරගනු ලබන සේවක ඇප තැන්පතු ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය කිරීම අවශ්‍ය වුවත්, පළාත් 06 කට අදාළ සේවක ඇප තැන්පතු අරමුදල් ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.245,151 ක ශේෂයක් පෙන්නුම් කර තිබුණි.

(ඇ) 2016 නොවැම්බර් 08 දින සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ප්‍රසිද්ධ කළ පුවත්පත් දැන්වීමට අනුව, අපේක්ෂිත සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී ICTAD ලියාපදිංචිය, පසුගිය වර්ෂ 03 ක විගණිත මූල්‍ය ප්‍රකාශන සහ CRIB වාර්තා බැංකුව විසින් සනාථ කිරීම සඳහා ලබාගත යුතුය. කෙසේ වුවද, බැංකුව විසින් ඉහත සඳහන් ලේඛන ලබාගෙන නොතිබුණි.

(ඈ) 2017 අගෝස්තු 01 දින රත්නපුර නගර ශාඛා කාර්යාලය විවෘත කරනු ලැබූ නමුත්, වායුසමීකරණ පද්ධතියක් නොමැති වීම හේතුවෙන් 2018 අගෝස්තු 28 දින දක්වා ඉදිකරනු ලැබූ ATM කුටිය භාවිතයට ගෙන නොතිබුණි.

## 4.4 වත්කම් ඌන උපයෝජනය

------------------------------

2013 ඔක්තෝබර් 21 දිනැති අංක 10/6/163 දරන නාගරික සංවර්ධනය අධිකාරියේ ලිපිය අනුව කල්බදු ඉඩමේ ඉමදූව ශාඛාව ඉදිකිරීම සඳහා බැංකුවට අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වුවද, 2018 පෙබරවාරි 28 දින දක්වා ශාඛාව ඉදිකර නොතිබුණි. ඉහත සඳහන් ඉඩමේ කල්බදු ගිවිසුම 2018 පෙබරවාරි 28 දින දක්වා ලබාගත නොහැකි විය.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකුවේ අනුමත සේවක සංඛ්‍යාව 2721 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 2395 ක් වී තිබුණි. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දිනට සේවක පුරප්පාඩු 326 ක් නිරීක්ෂණය විය.

(ආ) ජ්‍යෝෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී ශ්‍රේණියේ එක් තනතුරක අතිරික්තයක් සහ කාර්යාල සහායක සේවයේ සහ කම්කරු ශ්‍රේණියේ තනතුරු 45 ක අතිරික්තයක් පැවැති බව නිරීක්ෂණය විය.

**4.6 බැංකුවේ වෙළඳපොළ කොටස**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

පසුගිය වර්ෂයට සාපේක්ෂව බැංකුවේ වෙළඳපොල කොටස තැන්පතු මත සියයට 12.65 සිට සියයට 14.35 දක්වා සියයට 13 කින් සහ ණය හා අත්තිකාරම් මත සියයට 20.27 සිට 20.37 දක්වා සියයට 0.5 කින් වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**5.1.1 කොන්ත්‍රාත් පරිපාලනයේ දූර්වලතා**

බැංකුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

(අ) පේරාදෙණිය ශාඛාවට ATM කුටියක් ඉදිකිරීම හා අභ්‍යන්තර වැඩ වැඩිදියුණු කිරීම.

(i) ලංසු ලියවිලිවල පැවැති සුළු උල්ලංඝනය වීමක් හේතුවෙන් අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු ප්‍රතික්ෂේප කර තිබුණි.

(ii) වැඩ භාරගැනීමේ ලිපිය ප්‍රකාරව ප්‍රමාද වී බෙදාහැරීම් මත දඩ ගාස්තු ලෙස දිනකට රු.3,000 ක රේටයක් පැනවීම අවශ්‍ය වුවත් බැංකුව විසින් දින 28 ක් ප්‍රමාද වී බෙදාහැරීම් මත දඩ ගාස්තු නියම කර නොතිබුණි. කෙසේ වුවද, විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක්ද අත්සන් කර නොතිබුණි.

(iii) කොන්ත්‍රාත්කරු විසින් රු.180,426 ක් වටිනා ප්‍රමාණ පත්‍ර අයිතම් 13 ක් සම්පූර්ණ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) රත්නපුර නගර ශාඛා කාර්යාලයේ අභ්‍යන්තර වෙන්කිරීමේ කටයුතු

කොන්ත්‍රාත්කරු විසින් වටිනාකම රු.402,709 ක් වූ ප්‍රමාණ පත්‍රවල සඳහන් අයිතම 09 ක් සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සංවර්ධන බැංකු ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ අභ්‍යන්තර වෙන්කිරීම් කාර්යයන් හා ලී බඩු සැපයීම.

(i) 2017 මාර්තු 21 දිනැති විධායක ප්‍රසම්පාදන කමිටු තීරණයට පටහැනිව, වටිනාකම රු.207,703 ක අතිරේක වැඩ මානව සම්පත් අංශ ප්‍රධානියාගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව සිදුකර තිබුණි.

(ii) වැඩ භාරගැනීමේ ලිපිය ප්‍රකාරව, බෙදාහැරීම් ප්‍රමාද කිරීම් සඳහා දිනකට රු.3,000 බැගින් වන දඩ ගාස්තු පැනවීම අවශ්‍ය වුවත්, දින 32 ක ප්‍රමාද බෙදාහැරීම් සඳහා බැංකුව විසින් දඩ ගාස්තු නියම කර නොතිබුණි.

(ඇ) වෙනස් සංරචකවලින් සමන්විත විශාල කොන්ත්‍රාත් වෙන් වෙන්ව කුට්ටි (Slices) සහ පැකේජවලට බෙදා වෙන්ව ප්‍රසම්පාදනය කිරීම මඟින් විවිධ වෙළඳපොල හැකියාවන් සපුරාලීමට හැකිවේ. කෙසේ වෙතත්, විවිධ වූ සංරචකයන්ගෙන් සමන්විත වූ ප්‍රසම්පාදනයන් 03 ක් සම්බන්ධයෙන් මෙය අනුකූල වී නොතිබුණි. එබැවින් ප්‍රතිචාර දැක්වූ ප්‍රතිශතය ද අඩු වී තිබුණි.

## 5.2 අයවැය පාලනය

අයවැයගත හා තථ්‍ය ආදායම සහ වියදම් අතර සියයට 2 සිට සියයට 54 ක් දක්වා වූ වාසිදායක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය, බැංකුවෙහි ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ බැංකුවෙහි පද්ධති හා පාලන දුර්වලතා බැංකුවේ සභාපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ගනුදෙනු නිවැරදි ගිණුම්වලට පිටපත් කර නොතිබීම<br>දිගුකාලීන හිඟ පියවීමට අපොහොසත් වීම.<br><br>බැංකුවේ තොරතුරු පද්ධතියේ පාලන දුර්වලතා |
| (ආ) | ප්‍රසම්පාදනයන් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම. |
| (ඇ) | ණය පරිපාලනය | හඳුන්වා දෙන ලද පරිපාටි සමඟ අනුකූල නොවීම සහ දිගුකාලීන හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වීම. |